SEASL

# නිල් පිහිනුම් කකුළුවෝ පුවත් හසුන අංක 09


*පෝක් බොක්ක සහ මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිත නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තයේ ජෛව විද්‍යාත්මක සහ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග සහ තිරසාර ලෙස කළමනාකරණය කරන ලද ධීවර කර්මාන්තයක් සඳහා තොග තත්ත්වය පවත්වා ගැනීමට හඳුන්වා දුන් කළමනාකරණ මිනුම් ශ්‍රී ලංකා නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් 2108 වර්ෂයේ පළමු භාගයේදී ක්‍රියාවට නංවන ලදි. ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් සමාජීය වගකීම වැඩිදියුණු කිරීමට ගත් මූලාරම්භයන් සහ සැපයුම් දාමයෙහි සාධාරණත්වය, ශ්‍රීලංකාවේ කකුළු නිෂ්පාදන සඳහා වන ජාත්‍යන්තර වෙළඳපොළ කරා මෙම ධීවර කටයුතු සම්බන්ධ කිරීමට සහය විය. මෙම ක්‍රියාමාර්ගයන්හි විස්තර ශ්‍රී ලංකා නිල් පිහිනුම් කකුළුවෝ පුවත් හසුන 09 වන සංස්කරණයෙහි දැක්වේ.*

## **නිල් පිහිනුම් කකුළුවෝ** *තොග වල ජෛව විද්‍යාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම*



පෝක් බොක්ක සහ මන්නාරම් *ද්‍රෝණිය* ආශ්‍රිත සිව්වන වාර්ෂික නිල් පිහිනුම් කකුළුවෝ තොග තක්සේරුව ධීවර ප්‍රජාවගේ සහ මුහුදු ආහාර සමාගම් සමග සහයෝගීතාවයෙන් **පෙලජිකෝස් පුද්ගලික සමාගම** යාපනය,කිළිනොච්චිය ,මන්නාරම සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වල පෙබරවාරි සහ මාර්තු මාස වලදී මෙහෙයවන ලදි.මෙම තක්සේරුව අධීක්ෂණය කිරීම දිස්ත්‍රික් ධීවර කාර්යාල වල සුපරීක්ෂකවරුන් සහ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් සිදුවිය.පෝක් බොක්ක ආශ්‍රිත ධීවර කටයුතු වලදී ගැහැණු කකුළුවන් 6769ක මිනුම් මසුන් ගොඩ බෑමේ මධ්‍යස්ථාන 9කදී ලබා ගන්නා ලදි.මන්නාරම් *ද්‍රෝණිය* ආශ්‍රිත ධීවර කටයුතු වලදී ගැහැණු කකුළුවන් 3974 ක මිනුම් මසුන් ගොඩ බෑමේ මධ්‍යස්ථාන 9කදී ලබා ගන්නා ලදි.මෙම මධ්‍යස්ථාන වලදී ලබාගත් කකුළුවෙකුගේ මධ්‍යනය ප්‍රමාණය පෝක් බොක්ක ආශ්‍රිත ධීවර කටයුතු වලදී මි.මී 138 ක් වූ අතර මන්නාරම් *ද්‍රෝණිය* ආශ්‍රිතව මි.මී 131කි.අපරිණත කකුළුවන්ගේ ප්‍රතිශතය පෝක් බොක්ක ආශ්‍රිතව 7.4%වූ අතර මන්නාරම් *ද්‍රෝණිය* ආශ්‍රිතව 16%ක් විය.තොග තත්ත්ව තක්සේරුවේදී බිත්තර දැමීමේ හැකියාව තක්සේරු කිරීමට දිග මූලික කරගත් ක්‍රමය භාවිතා කරන ලදි(එල්.බී.එස්.පී.ආර්.).
මෙම යෙදවුම වෙරි වොන්ඩ(ර්)ෆුල් බෙයා(ර්) ෆුට් ඉකොලොජිස්ට් ටූල් බොක්ස් මගින් නොමිලේ ලබා ගත හැක.

පෝක් බොක්ක ආශ්‍රිතව 2018 වර්ෂයේ තොග තක්සේරුවේ ප්‍රතිඵල වලින් දැක්වෙන පරිදි පෝක් බෝක්කේ නිල් පිහිනුම් කකුළුවෝ තොගය තිරසාර ලෙස කළමනාකරණය කරන ලද නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කටයුතු සඳහා තිබිය යුතු මට්ටමට වඩා ඉහළ අගයක පවතින(ඉලක්ක නිර්දේශ අගය එස්.පී=30%)අතර සීමාන්ත ඉලක්කගත නිර්දේශ අගයට වඩාද බොහෝ ඉහළ අගයක් ගනී(එල්.ආර්.පී. එස්.පී=20%)




දිස්ත්‍රික්ක තුන අතර නිල් පිහිනුම් කකුළුවන්ගේ බිත්තර දැමීමේ හැකියාව (දකුණු පස බලන්න)නිල් පිහිනුම් කකුළුවන්ගේ පාරිසරික හැසිරීම,මසුන් ගොඩ බෑමේ මධ්‍යස්ථාන වල පිහිටීම සහ එක් එක් දිස්ත්‍රික්ක වල නිල් පිහිනුම් පිහිනුම් කකුළුවන් ගමන් කළ දුරට අනුරූප වෙයි.පෝක් බොක්කේ නැගෙනහිර වෙරළ ඉම ඔස්සේ ,කුඩා හෝ මධ්‍යම ප්‍රමාණයේ කකුළුවන් ප්‍රධානව දැකිය හැකි අතර ධීවරයන් වෙරළට ආසන්නව මසුන් ඇල්ලීම සිදු කරයි(< කි.මී 5).උතුරෙහි ඒ වටා වූ දූපත් සහ දකුණෙහි වූ මන්නාරම් දූපත් වල තුඩු දිශාවට බොහෝවිට මධ්‍යම හා විශාල ප්‍රමාණයේ කකුළුවන්ගෙන් යුත් මත්ස්‍ය අස්වැන්නක් ලැබෙන අතර ධීවරයන් වෙරළේ සිට <කි.මී 15Km පමණ දක්වා මසුන් ඇල්ලීමේ නිරතවෙයි.

2018 ඇගයීම ,පසුගිය අවුරුදු තුනක(එල්.බී.එස්.පී.ආර්.) ප්‍රතිඵල සමග අනුරූප වන අතර පෝක් බොක්කෙහි ධීවර කටයුතු තිරසාර මට්ටමට කළමනාකරණය වූ අතර දැනටත් එලෙසම කළමාකරණය වෙමින් පවතී.

| ටී.ආර්.පී | 2017 | 2016 | 2014/15 |
|---|---|---|---|
| 30% | 47% (46% – 49%) | 44% (43% – 45%) | 32% (31% - 33%) |

## *මන්නාරම්* **ද්‍රෝණිය** *ආශ්‍රිත තක්සේරුව* **2018**

මන්නාරම් *ද්‍රෝණිය* ආශ්‍රිත තක්සේරුවේ ප්‍රතිඵල ඒ ආශ්‍රිත නිල් පිහිනුම් කකුළු තොග තිරසාර ලෙස කළමනාකරණය කරන ලද නිල් පිහිනුම් කකුළු ධීවර කටයුතු සඳහා තිබිය යුතු මට්ටමට වඩා ඉහළ අගයක පවතින බවත්( ටී.ආර්.පී එස්.පී =30%); සීමාන්ත ඉලක්කගත නිර්දේශ අගයට වඩා බෙහෙවින් ඉහළ අගයක පවතින බවත් දක්වයි(එල්.ආර්.පී. එස්.පී=20%).

මෙහිදී දිස්ත්‍රික්ක අතර නිල් පිහිනුම් කකුළුවන්ගේ බිත්තර දැමීමේ හැකියාව තක්සේරු කරන ලදි.පුත්තලම් දිස්ත්‍රික්කයේ අඩු බිත්තර දැමීමේ හැකියාව ධීවර කර්මාන්තයේ ස්වරූපය නිරූපණය කරයි.බහුතරයක් නිල් පිහිනුම් කකුළු ධීවර කටයුතු විශේෂයෙන්ම සිදුවන්නේ පුත්තලම් මෝය සංකීර්ණයේ සෙවණ සහිත කිවුල් දිය පවතින ස්ථාන වලය. පුත්තලම් මෝය සංකීර්ණය කල්පිටිය උතුරෙහි කි.මී 35 කට වඩා පැතිරුණු වැලි තුඩු වලින් ආවරණය වී පවතින මී ඔය, කලා ඔය ,පන්පාරිප්පු ඔයෙහි ,මෝය වලින් සමන්විත වන අතර පෘතුගීසි බොක්ක හා ලන්දේසි බොක්ක ආවරණය කරයි.පුත්තලම් මෝය සංකීර්ණය ඉතා කුඩා පරිණත නොවූ සහ පරිණත වෙමින් සිටින කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ කකුළුවන්ට පරිපූර්ණ වාසස්ථානයකි.මන්නාරම් දිස්ත්‍රික්කයේ නිල් පිහිනුම් කකුළුන් ඇල්ලීමේ ස්ථාන පවතින්නේ වෙරළෙන් කි.මී10-15පමණ වූ මන්නාරම් *ද්‍රෝණියෙන්* ඔබ්බෙහි විවෘත ජලය සහිත ප්‍රදේශයේය.මෙහි මත්ස්‍ය අස්වැන්නෙහි මධ්‍යම සහ කුඩා ප්‍රමාණයේ කකුළුවන් ප්‍රමුඛව දැකිය හැක.

2018 ඇගයීම ,පසුගිය අවුරුදු තුනක(එල්.බී.එස්.පී.ආර්.) ප්‍රතිඵල සමග අනුරූප වන අතර මෙහි ධීවර කටයුතු තිරසාර මට්ටමට කළමනාකරණය වූ අතර දැනටත් එලෙසම කළමාකරණය වෙමින් පවතී.

| ටී.ආර්.පී | 2017 | 2016 | 2014/15 |
| --- | --- | --- | --- |
| 30% | 41% (39% – 43%) | 46% (42% – 50%) | 31% (29% - 33%) |


*මත්ස්‍ය තොගයෙහි තත්ත්වය වැඩිදියුණු කිරීමට සහ-මූල්‍යකරණයෙන් දායක වූයේ තැප්‍රොබේන් සීෆුඩ් ගෲප් සමාගම සහ ජාතික ධීවර ආයතන කකුළු කවුන්සිලයයි.*

## ධීවර කටයුතු වල පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම

සාගර වාසස්ථාන සඳහා ඇති බලපෑම:-පෝක් බොක්ක සහ මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව සිදුවන නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තයෙන් ,ඉතා වැදගත් වාසස්ථාන වලට බලපෑම තක්සේරු කිරීම සඳහා වූ ක්ෂේත්‍ර පර්යේෂණ **2018** වර්ෂයේ පළමු භාගය පුරාම නොනවත්වා සිදුවිය.පර්යේෂණය **,2016** වර්ෂයේ අවසන් වසර උපාධි අපේක්ෂකයන්ගේ ව්‍යාපෘතියක් ලෙස සාන්ත මොනිකා සීෆුඩ් සීමිත වගකීම් සමාගමෙහි මූල්‍ය සහයෝගයෙන් ආරම්භ විය.

ප්‍රජා මූලික සමීක්ෂණ භාවිතයෙන් කඩොලාන,මුහුදු තෘණ,හුණුගල් පර,කොරල් පර වල පිහිටීම පිළිබඳ නව තොරතුරු හා දත්ත ලබා ගන්නා ලදි.පෝක් බොක්ක සහ මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිත ධීවර කටයුතු ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක හතරෙහි ,ධීවර පරීක්ෂක කොට්ඨාශ **17**ක **70**කට අධික ධීවර සංගම් සමග සමීක්ෂණය මෙහෙයවීම සිදු කරන ලදි.නව ජී..පී.එස් දත්ත, එල්.කේ.එස්.අයි.එම් පුද්ගලික සමාගම විසින් **2016** වර්ෂයේදී සංවර්ධනය කරන ලද ස්මාර්ට් ජංගම දුරකථන "නෙට් ෆයින්ඩර්"යෙදවුම මගින් එකතු කරන ලදි.


මෙම ධීවර කටයුතු දෙකටම අදාළ වූ නව ජී.පී.එස්.දත්ත සහ ඩිජිටල්කරණය කරන ලද ප්‍රජා මූලික සමීක්ෂණ,ඉතා වැදගත් සාගර වාසස්ථාන වල ඩිජිටල් දත්ත ගබඩාවට එක් කරන ලදි. එම දත්ත ගබඩාව ,පෝක් බොක්කෙහි (දකුණු පස බලන්න) හා මන්නාරම් ද්‍රෝණියහි ඉතා වැදගත් සාගර වාසස්ථාන වලට නිල් පිහිනුම් කකුළු ධීවර කටයුතු වලින් සිදුවන පාරිසරික බලපෑම තක්සේරු කිරීමට යොදා ගන්නා ලදි.(අනෙක් පස බලන්න)



ප්‍රජා මූලික සමීක්ෂණ වල මූලික විශ්ලේෂණයන් දක්වන පරිදි,පෝක් බොක්කෙහි 10.8%ක ඉතා වැදගත් සමුද්‍රීය වාසස්ථාන සහ මන්නාරම් ද්‍රෝණියහි ඉතා වැදගත් සමුද්‍රීය වාසස්ථාන 12.3%ක් සඳහා, මුහුදු පතුලේ කකුළුවන් ඇල්ලීමට යොදා ගන්නා යෙදවුම් මගින් බලපෑමක් තිබේ.ඉහළ මට්ටමේ අන්තර්ක්‍රියා නිරීක්ෂණය කිරීමට හැකි වූයේ පෝක් බොක්කෙහි 17.1% ක් හා මන්නාරම් ද්‍රෝණියහි 13.7% ක් වූ මුහුදු තෘණ භූමි වලය. ශ්‍රීලංකාවේ සියලු මුහුදු තෘණ භූමි වලින් 45%ක් (හෙක්ටයාර් 342,751)පිහිටා ඇත්තේ පෝක් බොක්ක (හෙක්ටයාර් 88,524 / 25%) සහ මන්නාරම් ද්‍රෝණිය (හෙක්ටයාර් 68,452 / 20%) ආශ්‍රිත නොගැඹුරු පෝෂ්‍ය ද්‍රව්‍ය බහුල ජලයේය.

| | පෝක් බොක්ක (හෙක්ටයාර්) | | | මන්නාරම් ද්‍රෝණිය (හෙක්ටයාර්) | | |
|---|---|---|---|---|---|---|
| | සම්පූර්ණ | බලපෑම? | % | සම්පූර්ණ | බලපෑම? | % |
| කඩොලාන | 6,732 | 1 | 0.0% | 1,919 | - | 0.7% |
| මුහුදු තෘණ | 88,524 | 10,962 | 12.4% | 68,452 | 9,364 | 13.7% |
| හුණුගල් පර | 16 | 0 | 0.0% | 6,001 | 181 | 3.0% |
| කොරල්පර | 7,235 | 69 | 1.0% | 2,598 | 190 | 7.3 |
| සමුද්‍රීය වාසස්ථාන | **102,507** | **11,031** | **10.8%** | **78,970** | **9,735** | **12.3%** |

*ධීවර කටයුතු වල පරිසර විද්‍යාත්මක තත්ත්වය දියුණු කිරීමට සාන්ත මොනිකා සීඵඩ් සමාගම විසින්,ෆිශ්වයිස් හි ආර්.වී.එස්.පී හා එන්.අයි.එෆ්.හි කකුළුවන් සඳහා වූ කවුන්සිලය හරහා සහ-මූල්‍යකරණයෙන් දායක විය.*




## *ශ්‍රී ලංකා නිල් පිහිනුම් කකුළු ධීවර කටයුතු කළමනාකරණය වැඩිදියුණු කිරීම*

| | Compliance | | |
|---|---|---|---|
| | 2017 | 2018 | % |
| **පෝක් බොක්ක** | **92%** | **97%** | **+3%** |
| *යාපනය* | *93%* | *98%* | *+6%* |
| කිළිනොච්චිය | *94%* | *98%* | *+4%* |
| මන්නාරම | *89%* | *95%* | *+6%* |
| *මන්නාරම් බොක්ක* | **85%** | **94%** | **+9%** |
| *මන්නාරම* | *91%* | *99%* | *+8%* |
| *පුත්තලම* | *83%* | *92%* | *+9%* |

2016දී, නිල් පිහිනුම් කකුළු සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය සඳහා, නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තය සඳහා වූ පාලනය පිළිබඳ සංග්‍රහය, ධීවර ප්‍රජාවගේ සහභාගිත්වයෙන් සංවර්ධනය කරන ලදි. නිල් කකුළු තොගයෙහි තත්ත්වය නිරෝගී මට්ටමක පවත්වා ගැනීම ඉලක්ක කරගත් යහපත් කළමනාකරණ මිනුම් සහ සාගර පරිසරය සහ ඒ ආශ්‍රිත විශේෂ සඳහා පවතින බලපෑම අවම කිරීම මෙම සංග්‍රහය මගින් අනුමත කර ඇත.මෙම සංග්‍රහය ඩී.එෆ්.ඒ.ආර් හි අධ්‍යක්ෂක ජනරාල් විසින් 2017 පෙබරවාරි මාසයේදී අනුමත කරන ලදි.පළමු අනුකූලතා සමීක්ෂණය, මෙම ධීවර කටයුතු දෙක සඳහාම 2017 අප්‍රියෙල් සහ මැයි මාස වලදී මෙහෙයවන ලදි.දෙවන සමීක්ෂණය මෙම වර්ෂය ආරම්භයේ සම්පූර්ණ කරන ලදි.ප්‍රතිඵල වලට අනුව නීති සංග්‍රහය සමග අනුකූලතාවය සමස්ථ වශයෙන් දිස්ත්‍රික් සියල්ලේම මෙම ධීවර කටයුතු දෙක සඳහාම වැඩි වී ඇත.



ධීවර පරීක්ෂක කොට්ඨාශ 17න් නිල් පිහිනුම් කකුළු ධීවර නියෝජිතයන් 68දෙනෙක් මගින් පෝක් බොක්ක සහ මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව ,නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තය සඳහා ධීවර කළමනාකරණ සැළසුම සමාලෝචනය,සංශෝධනය සහ යාවත්කාලීන කිරීම ජුනි මස අගදී සිදුවිය.ධීවර පරීක්ෂකවරුන් විසින් ඔවුන්ගේ කොට්ඨාශ වල මෙම රැස්වීම් වලට පෙර ධීවර කළමනාකරණ සැළසුම් සහ ඕනෑම සංශෝධනයකට හෝ වෙනස් කිරීමක් පිළිබඳ සාකච්ඡා කිරීමට බී.එස්.සී.ධීවර ප්‍රජාව සමග රැස්වීම් සංවිධානය කරන ලදි.පෝක් බොක්ක සහ මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව ධීවර කළමනාකරණ සැළසුම් ජුනි මස අගදී ධීවර නියෝජිතයන් විසින් දිස්ත්‍රික් රැස්වීම් වලදී අනුමත කරන ලදි.එක් එක් දිස්ත්‍රික්ක වල සහකාර අධ්‍යක්ෂකවරුන් විසින් ධීවර කළමනාකරණ සැළසුම් අධ්‍යක්ෂක ජනරාල් වෙත භාර දීම සිදු කරන ලදි.ධීවර කළමනාකරණ සැළසුම් 2ක්, දිස්ත්‍රික් ධීවර කළමනාකරණ ප්‍රදේශ යෝජනා සමග ඒකාබද්ධ වනු ඇති අතර ඩී.එෆ්.ඒ.ආර් විසින් දැනට එය සකස් කරමින් පවතී.

නිල් පිහිනුම් කකුළු ධීවරයන් සඳහා අදාළ රෙගුලාසි/අපනයනකරුවන් සඳහා වූ කාර්ය ලේඛනය: පසුගිය වසරේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් නීතිපති දෙපාර්තමේන්තුව (ඒ .ජී ) වෙත ඉදිරිපත් කළ නිල් පිහිනුම් කකුළු ධීවර කටයුතු සඳහා වූ කෙටුම්පත් රීති මෙම වසරේ මුල් භාගයේදී නැවත ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත එවා ඇත.එහි ආනයන ,අපනයන සහ නැවත අපනයනය කිරීමේ පනත (2017)යටතේ නිල් පිහිනුම් කකුළුවන් අපනයනය සඳහා වන උපලේඛනයක් සකස් කිරීමද ඇතුළත්ව වෙනස්කම් ගණනාවක් කෙටුම්පත් රීති සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් යෝජනා කර තිබේ.මෙම උපලේඛනය එතැන් සිට කෙටුම්පත් කොට විවේචන සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදි.අපනයනකරුවන්ට ඔවුන්ගේ සැපයුම්කරුවන්ට සහ නියෝජිතයන්ට මිලදී ගත හැකි අවම ප්‍රමාණය මෙම උපලේඛනයෙහි ඇතුළත්ය.නීතිපති දෙපාර්තමේන්තුව විසින් බී.එස්.සී.ධීවර කටයුතු සඳහා වූ රීතීන් ජුනි මසදී අනුමත කරන ලදි.නිල් පිහිනුම් කකුළු අස්වැන්න ලබා ගැනීමේදී රෙගුලාසි මගින් ඉදිරිපත් කර ඇති නීතිමය විධිවිධාන පහත පරිදි වේ.

*(a).* දැල් ඇසෙහි ප්‍රමාණය මිලිමීටර් *114.3(4 1/2")*හෝ වෙලු **6**කට වඩා වැඩි පතුලේ සවි කරන ලද දැල් භාවිතා කර නිල් *පිහිනුම්* කකුළු අස්වනු ලබා ගැනීම
*(b).*දෘඩ හෝ ඇම යෙදු කඩා වැටෙන උගුල් නිල් *පිහිනුම්* කකුළු අස්වනු ලබා ගැනීම සඳහා යොදා ගැනීම
කිසිවෙකුට කළ නොහැක.
*(c).*සෑම පුද්ගලයෙක්ම භාවිත කොට අවසන්,හානි වූ හෝ ඉවත දමන දැල් පරිසරය ආරක්ෂා වන පරිදි ඉවත් කළ යුතුය.
නිල් *පිහිනුම්* කකුළුවන් හෝ නිල් *පිහිනුම්* කකුළු නිෂ්පාදිත ,අස්වනු ලබා ගැනීම,විකිණීම,මිලදී ගැනීම,ප්‍රවාහනය,නැවත විකිණීම,නිෂ්පාදනය සහ අපනයනය කිරීමේ යෙදී සිටින සියළු පුද්ගලයන් ,නියෝජිතයන් හෝ සමාගම් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ඉල්ලීම් කළ විට අදාළ ඕනෑම තොරතුරක් හෝ දත්ත ලබා දිය යුතුය.

*බී.එස්.සී කළමනාකරණය වැඩිදියුණු කිරීමට ජාතික ධීවර ආයතනයේ කකුළුවන් පිළිබඳ කවුන්සිලය සහ-මූල්‍යකරණයෙන් දායක විය.*



## *සමාජීය වගකීම සහ ආර්ථික සාධාරණත්වය වැඩිදියුණු කිරීම*

*තිරසාර ලෙස කළමනාකරණය වන කුඩා පරිමාණ ධීවර කටයුතු වල ඉහළ වැදගත්කමක් ඇති අංග ලෙස සමාජීය වගකීම සහ ආර්ථික සාධාරණත්වය දැක්විය හැක.තිරසාර ලෙස කළමනාකරණය වන ධීවර කටයුතු වලින් ලබාගත් මුහුදු ආහාර වලින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභයන් සාධාරණ ලෙස සැපයුම් දාමය ඔස්සේ බෙදී නොයන්නේ නම් සම්පත් තිරසාර ලෙස භාවිතයට ගැනීමට කුඩා පරිමාණ ධීවරයන්ට දිරිදීමනා කොහිද?ඊට සමානව මුහුදු ආහාර සැපයුම් දාමය තුළ ,ළමා ශ්‍රමිකයන් ,සංක්‍රමණික ,ඇපයට බැඳුණු හෝ වහල් ශ්‍රමිකයන් හෝ දීන තත්ත්ව යටතේ වැඩකරන ශ්‍රමිකයන් සිටීනම් හුදෙක් තිරසාර ලෙස ලබා ගත් පමණින් පාරිභෝජකයන් මුහුදු ආහාර මිලදී නොගනු ඇත.ශ්‍රී ලංකා නිල්* පිහිනුම් *කකුළු අස්වැන්න ලබා ගන්නේ ශ්‍රීලංකාවේ ධීවරයන් පමණි.ශ්‍රීලංකාවේ නිල් කකුළු ධීවර කර්මාන්තයේ නිල් කකුළු නිෂ්පාදන දාමය තුළ ළමා කම්කරුවන්,සංක්‍රමණික ,ඇපයට බැඳුණු හෝ වහල් කම්කරුවන් සේවයේ යෙදෙන බවට සාක්ෂි නොමැත.*
*ශ්‍රී ලංකාවේ නිල් කකුළු ධීවර කටයුතු හා සැපයුම් දාමය සඳහා සමාජීය වගකීම හා ආර්ථික සාධාරණත්වය සඳහා වූ වැඩිදියුණු කිරීම් වලට සහ-මූල්‍යකරණයෙන් තැප්‍රොබේන් සීෆුඩ් සහ එන්.එෆ්.අයි හි කකුළුවන් පිළිබඳ කවුන්සිලය දායක විය.*

## *ශ්‍රී ලංකාවේ නිල්* **පිහිනුම්** *කකුළු ධීවර කර්මාන්තය /ධීවර කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ තත්ත්ව වාර්තාව*

සෑම මාස හයක පමණ කාලයකදී,තිරසාර ලෙස ලබාගත් මුහුදු ආහාර සඳහා වූ අන්තර්ජාතික ප්‍රමිතීන් තුනකට එරෙහිව ධීවර කටයුතු සඳහා අභ්‍යන්තර තක්සේරුවක් සිදු කර ඇත.2018 ජුනි මස අග වන විටදී ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අනුව ධීවර කටයුතු....

S.F.P අවස්ථාව *6*හි පවතී:-ස්වාධීන /අන්තර්ජාතික සහතික කිරීම:-ශ්‍රීලංකා නිල් *පිහිනුම්* කකුළු ධීවර කර්මාන්තය *2016*වර්ෂයේ සිට මොන්ටරි බේ ඇක්වේරියම් සීෆුඩ් වොච් ප්‍රෝගෑම් මගින් ස්වාධීනව තක්සේරු කිරීම සහ සාගර කළමනාකාරීත්ව කවුන්සිලය(එම්.එස්.සී.)ධීවර ප්‍රමිතීන්ට එරෙහිවද තක්සේරු කරන ලදි(පහත බලන්න)

***M.S.C හි ධීවර ප්‍රමිතීන්ට එරෙහිව* 0.83 *,ලකුණු ලබා ගත හැකිවිය(ඉලක්කය>=*0.60).*නොවැම්බර් මාසයේදී මෙම ධීවර කටයුතු දෙකම එම්.එස්.සී හි ධීවර ප්‍රමිතීන්ට එරෙහිව පූර්ව තක්සේරු කිරීම සඳහා එම්.එස්.සී අනුමත සහතික ලත් ආයතනයක් වෙත භාර දෙන ලදි.එම්.එස්.සී පූර්ව තක්සේරුව සම්පූර්ණ කර භාරදීම මාර්තු මසදී සිදුවිය.පූර්ව තක්සේරුකරණයේ පිරිවැයට සහ-මූල්‍යකරණයෙන් දායක වූයේ තැප්‍රොබේන් පුද්ගලික සමාගම සහ වේවිජ්ස් ඉම්පෝට් එක්ස්පෝට් සමාගම විසිනි.***

සීෆුඩ් වොච් හි ධීවර කටයුතු සඳහා වූ නිර්ණායක වලට එරෙහිව *3.18*ක අගයක ලබා ගත හැකිවිය.(ඉලක්කය>=*2.20)*

ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය සහ ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි සාමාජිකයන් ජාතික ධීවර ආයතනයේ කකුළු කවුන්සිලය (එන්.එෆ්.අයි.සී.සී) මගින් නිර්ලෝභීව 2013 සිට නොකඩවා ලබාදුන් සහයෝගයට ස්තූතිය පළ කරයි.එසේම, ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සාමාජිකයන් ශ්‍රීලංකා නිල් පිහිනුම් කකුළු පුවත් හසුන මෙම සංස්කරණයේ විස්තර කොට ඇති උප ව්‍යාපෘති එකක් හෝ කිහිපයක් සඳහා ආයෝජනය කළ තැප්‍රොබේන් පුද්ගලික සමාගම, සාන්ත මොනිකා සීමිත වගකීම් සමාගම, ෆිෂ් වයිස් සහ වේවිජ්ස් ඉම්පෝට් එක්ස්පෝට් යන සමාගම් වලට ස්තූතිය පළ කරයි.

*නිල් පිහිනුම් කකුළු පුවත් හසුන් 9යේම මෑදු පිටපත් ඉංග්‍රීසි,සිංහල හා දෙමළ බසින් ලබාගත හැක. පිටපත් ලබා ගැනීම සඳහා ඉල්ලීම් මෙම විද්‍යුත් තැපැලට යොමු කරන්න.*

steve@pelagikos.lk